**හානා හීය පානා අඬහැරෙන් දැනේ**

**සිංහල සාහිත්‍ය සංග්‍රහය**

**10 ශ්‍රේණිය**

**II වාරය**

**නිපුණතාව** :- 14.0 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය පිළිබඳ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම :-** 14.3 ජනකවිවල සාහිත්‍යමය අගය විමසයි.

**ඉගෙනුම් පල** :-

- නිර්දිෂ්ට ජනකවිවල විශේෂත්වය කවි වල විශේෂත්වය පැහැදිලි කරයි.
- නිර්දිෂ්ට ජනකවිවල ගැබ් වූ උපදේශ හඳුනාගෙන අගය කරයි.
- ජනකවි රස විඳිමින් විචාරය කරයි.

## ක්‍රියාකාරකම - 1

- **කෙටි පිළිතුරු සපයන්න.**

1. ජනකවිවලින් සිදු වුයේ කුමන කාර්යභාරයක් ද?

   ........................................................................................................

2. ජනකවි පැවත ආවේ කෙසේ ද ?

   ........................................................................................................

3. සිංහල ජනකවියේ ඉතිහාසය කෙතරම් ඈත කාලයකට අයත් ද ?

   ........................................................................................................

   ජනකවි පිළිබඳ කරුණු සඳහන් වන පැරණි ම මූලාශ්‍රය කුමක් ද ?

   ........................................................................................................

4. එහි සඳහන් වන සිදුවීම එක් වැකියකින් ලියන්න.

   ........................................................................................................

## ක්‍රියාකාරකම - 2

- වරහනින් තෝරා වගුව සම්පූර්ණ කරන්න

| ගොවිතැන ආශ්‍රිත ජනකවි | රැකියා ආශ්‍රිත ජනකවි | ක්‍රීඩා ආශ්‍රිත ජනකවි | ශාන්තිකර්ම ආශ්‍රිත ජනකවි | සමාජීය අවශ්‍යතා ආශ්‍රිත ජනකවි |
|---|---|---|---|---|
| | | | | |

( ගොයම් කවි, පැල් කවි, බඹර කවි, කුරක්කන් කවි, තේරවිලි කවි, උපදේශ කවි,මල් යහන් කවි, දෙවොල් මඩු කවි, ඔන්චිලි වාරම් කවි, රබන් කවි, ලී කෙළි කවි, ඔලිඳ කෙළි කවි, නෙළුම් කවි, කමත් කවි, පතල් කවි, පාරු කවි, කරත්ත කවි, නැළවිලි කවි, කුඹල් කවි, කෝල්මුර කවි, ගම්මඩු කවි, තෙතඟු කවි, තොවිල් කවි,විවීම් කවි, අං කෙළි කවි, පොල් කෙළි කවි, වස් කවි,සෙත් කවි)

## ක්‍රියාකාරකම - 3

පහත සඳහන් පදවල අර්ථ ඉදිරියේ ඇති පද අතුරින් තෝරා ඉදිරියෙන් ලියන්න.

1. කෙටුම -…………………………………
2. හීය -…………………………………
3. කූරින් -…………………………………
4. බොරැල්ල -………………………………
5. රන් විමනේ -………………………………
6. මුවා වෙලා-………………………………
7. සැදු මුත්-…………………………………
8. මිණි බරණින් -…………………………
9. සකිය-……………………………………
10. ගත -……………………………………

සීසෑම | සැහවී | කැපීම | රළු පොළව | ශරීරය | මිතුර | මැණික් ආභරණවලින් | රන් මාලිගාවේ | මාළුවන් | සැරසුණත්

## ක්‍රියාකාරකම - 4

➢ **පහත සඳහන් කියමන් ප්‍රකාශිත කවි පද පද්‍ය පන්තියෙන් සොයා ලියන්න.**

1. යන්ට ඇරලා වැලමිටෙන් අල්ලනවා වගේ

 ……………………………………………………………………………………………………

2. රිලවුන්ට ඉණිමං මොකට ද?

 ……………………………………………………………………………………………………

3. වැරදි වීම මනුස්ස ගතියක්

 ……………………………………………………………………………………………………

4. ඇඟිල්ලේ තරමට ඉදිමෙනු

 ……………………………………………………………………………………………………

5. දාරළුවේ තරම දැනගෙන උඩ පනින්න ඕනෑ

 ……………………………………………………………………………………………………

6. යුද්දෙට නැති කඩුව කොස් කොටන්න ද?

 ……………………………………………………………………………………………………

7. පැණි වරකා ගහටත් හෙණ ගහනවලු

 ……………………………………………………………………………………………………

## ක්‍රියාකාරකම - 5

➢ **හිස්තැන් පුරවන්න.**

1. මුල පාදාගන්න ආකාරයෙන් ……………………හඳුනාගත හැකි ය.
2. ඇවිදින කඩිසරබවින් බවින් ……………………හඳුනාගත හැකි ය.
3. අත අල්ලන ආකාරයෙන් ……………………හඳුනාගත හැකි ය.
4. අඬහැරෙන්…………………… හඳුනාගත හැකි ය.
5. ……………………………වැසි කාලයේ විල් වලට එති.
6. බැස යන වතුරින් ……………………ගන්න.
7. පැන යා හැකි රිලවුන්ට ……………………………කුමකට ද ?

8. මේ ලොවේ .......................................නැති කෙනෙක් නැත.

9. භූමියේ උස් බව සලකා ..................................... කැපිය යුතු ය.

10. රළු පොළොවේ ස්වභාවය දැන.............................. පැනිය යුතු ය.

11. කඳ බැඳ ගත යුත්තේ...................... ප්‍රමාණය අනුවයි.

12. ඇස නැතිව .............................. කුමට ?

13. දත් නැතිව උක් දඬු ................................

14. ............................ ජීවත් වුව ද දුක ඇති වේ.

15. .............................. ආහාර ගත්ත ද කුසගිනි ඇති වේ.

16. ................................ සැරසුණත් ශරීරය මහලු වේ.

17. ................................ අකුණු වදී.

18. නෙළා ගත් පලා ...................................දැක ඉවත නොදමන්න.

19. එළියෙන් සෑහී .................................. දියේ නොදමන්න.

20. ................................ අවශ්‍යවන්නේ යුද්ධයේදී ම ය.

## ක්‍රියාකාරකම - 6

➢ **පහත සඳහන් උපදේශ සහිත ව පද්‍යා පදය හිස්තැන මත ලියන්න.**

1. අමුත්තන්ට කරන සංග්‍රහයේ ප්‍රමාණය චර්යාවෙන් පෙනේ.

...........................................................................................................................

2. ජීවිතයේ අවසන් සමයේ දී වත් පින් දහම් කර ගත යුතු ය.

...........................................................................................................................

3. අපතේ යන සම්පත්වලින් සුළු ප්‍රයෝජනයක් වත් ගත යුතු ය.

...........................................................................................................................

4. හැකියාව ඇති අයට උපකාර අවශ්‍ය නොවේ.

...........................................................................................................................

5. ලොව සියලු දෙනා අතින් වැරදි සිදු වෙයි.

...........................................................................................................................

6. ශරීර ශක්තිය නොමැති ව රණ්ඩු ආදියට නොයා යුතු ය.

........................................................................................................................................

7. මොහොතක් ලබන සැපකට මුලා වී ජීවිතය අඳුරු කර නොගත යුතු ය.

........................................................................................................................................

8. යම් කාර්යයක් සාර්ථක වේ ද යන්න කාර්ය ආරම්භයේ සූදානම අනුව වටහා ගත හැකි ය.

........................................................................................................................................

9. වටිනා දේ පවා විනාශයට පත්වේ.

........................................................................................................................................

10. කොපමණ සැප සම්පත් භුක්ති වින්ද ද දුක දුරු නොවේ.

........................................................................................................................................

## ක්‍රියාකාරකම - 7

➢ **යහපත් ජීවිතයකට ජන කවියෙන් ලද හැකි ආභාසය නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.**

**1. ප්‍රවේශය**

**2. විග්‍රහය -** යහපත් ජීවිතයකට ජන කවියේ ආභාසය

- ගොඩැල්ලේ තරම දැනගෙන ළිඳ කපනු.
- වරද පෙනෙන තරමට වැරදුණා නොවේ.
- ගසට කෙටුම ගස මුල පැයුමෙන් දැනේ
- අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා

**3. නිගමනය**

# <u>පිළිතුරු</u>

## <u>ක්‍රියාකාරකම - 1</u>

1. මිනිස් සන්තානය තුළ පවතින දුක, කණගාටුව, සතුට,  කලකිරීම, කාන්සිය, වැනි හැඟීම් ප්‍රකාශනයයි.
2. ජනයා අතරට මුඛ පරම්පරාවෙනි.
3. අනුරාධපුර යුගය
4. සංයුක්ත නිකායේ අට්ඨ කතාව වූ පරමත්ථ ජෝතිකාව
5. කෙතක් රකිමින් සිටි කාන්තාවක් ගැයූ ජන කවි අසා තෙරුන් වහන්සේ හැට නමක් රහත් වූ හ.

## <u>ක්‍රියාකාරකම - 2</u>

- **<u>ගොවිතැන</u>** -  ගොයම්, පැල්, කුරක්කන්, නෙළුම්, කමත්
- **<u>රැකියා-</u>**   බමර, පතල්, පාරු, කරත්ත, කුඹල්, විවීම්
- **<u>ක්‍රීඩා</u>** - ඔන්චිලි වාරම්, රබන්, ලී කෙළි, ඔලිඳ, අංකෙළි, පොල් කෙළි
- **<u>ශාන්ති කර්ම</u>** -  මල් යහන්, දෙවොල් මඩු, ගම්මඩු, කෝල්මුර, තොවිල්, සෙත්
- **<u>සාමාජීය</u>** -  තේරවිලි, උපදේශ,  නැළවිලි, තෙතඟු, වස්, සෙත්

## <u>ක්‍රියාකාරකම - 3</u>

1. කැපීම
2. සී සෑම
3. මාළුවන්
4. රළු පොළව
5. රන් මාලිගාවේ
6. සැඟ වී
7. සැරසුණත්
8. මැණික් ආභරණවලින්
9. මිතුරා
10. ශරීරය

## ක්‍රියාකාරකම - 4

1. අමුතු බත් දීම අත ඇල්ලුමෙන් දැනේ
2. පනින රිලවුන්ට ඉනිමං කමක් නැත
3. වැරදි නැති කෙනෙක් නැත සකිය මේ ලොවේ
4. තමන්ගේ තරම දැනගෙන කල් හරිනු
5. බොරැල්ලේ තරම දැනගෙන උඩ පනිනු
6. යුද ඇති දා නැති කඩු කොස් කොටන්න ද?
7. පැණි වරකා ගසටත් හෙණ නො වදී ද?

## ක්‍රියාකාරකම - 5

1. ගස කැපීම
2. කාර්යශූර බව
3. ආගන්තුක සත්කාරය
4. සී සැමේ සාර්ථක බව
5. මාළුවෝ
6. දෝතක්වත්
7. ඉණිමං
8. වරද
9. ළිඳ
10. උඩ
11. කඩුල්ලේ
12. පොත
13. ගිනි තපින්නද
14. රන් මාලිගාවක
15. මී පැණි සමඟ
16. මැණික් ආභරණ
17. පැණි වරකා ගසටත්
18. දුවන මුවන්
19. ගිනි හුළු
20. කඩුව

## ක්‍රියාකාරකම - 6

1. අමුතු බත් දීම අත ඇල්ලුමෙන් පෙනේ
2. නහින දෙහින කාලෙට පින් කෙරුම යුතු
3. බහින දියෙන් දෝතක් මුත් ගතොත් ඇත
4. පනින රිළවුන්ට ඉනිමං කමක් නැත
5. වරද නැති කෙනෙක් නැත සකිය මේ ලොවේ
6. වෙර නැති දා ගහ ගත්තේ දිනන්ට ද ?
7. විදුලි එළිය දැක ගිනිහුළ දියේ හෙළා
8. ගසට කෙටුම ගස මුල පෑයුමෙන් දැනේ
9. පැණි වරකා ගසටත් හෙණ නො වදීද්ද?
10. රන් විමනේ සිටි මුත් දුක නැති වෙද්ද

## ක්‍රියාකාරකම - 7

- දී ඇති මඟ පෙන්වීම අනුව විචාරය ලියන්න.